(හයවැනි පාර්ලිමේන්තුව — සිව්වැනි සභාවාරය)

අංක. 44.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2010 ජනවාරි මස 05 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0090/'09

1.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1977 දේශපාලන පලිගැනීම්වලට ලක්වූවන්ගේ හා 1980 ජූලි වැඩ වර්ජනයෙන් රැකියා අහිමිවූවන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රශ්නය විසඳීම සඳහා පත්කළ කමිටු කවරේද;

(ii) එම කමිටු පත්කළ දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කමිටු මගින් මෙතෙක් වාර්තා හෝ විසඳුම් ලබා නොදීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) විසඳුම් නොලැබීම නිසා අසාධාරණයට ලක්ව සිටින විශ්‍රාමිකයින්ගේ ගැටලු සහ ඒ සම්බන්ධව ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0288/'09

2.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1996 වසරේ පළමු පන්තියට උසස්වීම් ලැබූ, දුම්රිය ස්ථානාධිපති කේ. සී. ඩබ්ලිව්. ආර්. ප්‍රනාන්දු මහතා ඇතුළු පිරිසකට වැටුප් වර්ධක 7ක විෂමතාවයක් ඇති බවත්;

(ii) මෙතෙක් එය නිවැරදි කිරීමට කටයුතුකර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) 1994.02.11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/94 හි 5. 3. 1. වගන්තිය හා 2/97 (iii) වැටුප් පරිවර්තනය නිවැරදිව ක්‍රියාත්මක නොකිරීමෙන් වැටුප් වර්ධක 2ක් අහිමිව සහ 1994.08.01 දින සිට 1999.11.11 දක්වා එකම වැටුපෙහි රැඳීසිටි මෙම පිරිසට රා. ප. ච. 7/2003 අනුව 1997, 1998 සහ 1999 වසර තුනට හිමි වැටුප් වර්ධක 3 ද අහිමිකර ඇත්තේ කෙසේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අයට වඩා වසර තුනකට පසු උසස්වීම් ලැබූ ජ්‍යෙෂ්ඨත්වයෙන් වසර 3ක් අඩු නිලධාරීන්ගේ වැටුප අදාළ නිලධාරීන්ගේ වැටුපට වඩා වැටුප් වර්ධක 3ක් ඉහළට තබා ඇත්තේ කවර පදනමක් යටතේද;

(ii) මෙය රා. ප. ච. 11/94 උල්ලංඝණය කරමින් ජ්‍යෙෂ්ඨත්වය නොසලකා හැරීමක් නොවන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0362/'09

3.

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කෑගල්ල දිස්ත්‍රික්කයට මෙවර යල් කන්නය වෙනුවෙන් දෙනු ලබන පොහොර සහනාධාරය සඳහා ඇණවුම් කරන ලද පොහොර වර්ග ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වගාකර මාසයකට ආසන්න කාලයක් ගතවී ඇතත් තවමත් ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන වෙත එම සහනාධාර පොහොර නිකුත් කර නොමැති බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එලෙස ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන වෙත පොහොර ලැබීම ප්‍රමාද වීමට හේතු කවරේද;

(ii) ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන වෙත පොහොර ප්‍රවාහනය සඳහා ටෙන්ඩර් කැඳවීමක් කළේ නම්, ඒ කවදාද;

(iii) පොහොර ප්‍රවාහනය බාර දෙනු ලැබුවේ කවුරුන් වෙතද;

(iv) එම ආයතනයේ නම හා ලිපිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නියමිත කාලයට ගොවීන් වෙත සහනාධාර පොහොර නොලැබීමෙන් සිදුවන අපහසුතාව වළක්වා ගැනීම සඳහාත්, වෙන් කරනු ලබන ප්‍රතිපාදන වලින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහාත් ගනුලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0512/'09

4.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2003 ඇතිවූ මහා ගංවතුරින් විනාශයට පත්වූ එප්පල වැල්පාලම වෙනුවට ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදලින් ත්‍රිරෝද රථයක් යා හැකි ලෙස පාලමක් සකස් කිරීමට අනුමත වූ බවත්;

(ii) යෝජිතව තිබූ එම පාලම වෙනත් ස්ථානයකට ගෙනයාමට නිලධාරීන් දැරූ උත්සාහයට ගම්වාසීන්ගේ බලවත් විරෝධය පළවූ බවත්;

(iii) නිලධාරීන් ඇතිකළ අනවශ්‍ය ගැටලුව හේතුවෙන් ආසියානු සංවර්ධන බැංකුව එම පාලම සෑදීම තාවකාලිකව නතර කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නැවතත්, ආසියානු සංවර්ධන බැංකුවේ ශ්‍රී ලංකා කළමණාකරු මෙම පාලම සෑදීම ආරම්භ කිරීමට කැමැත්ත ඇතිව, ඒ සම්බන්ධයෙන් තවලම ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් තොරතුරු විමසා ඇති බවත්;

(ii) දැනට තාවකාලිකව තහඩු යොදා අළුත්වැඩියා කරන ලද එප්පල වැල් පාලම ඉතාම අබලන්වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නියමිත ස්ථානයේම එම පාලම සකස් කිරීමට නිර්දේශ ලබාදෙන ලෙස තවලම ප්‍රාදේශීය ලේකම්වරයාට එතුමා අවශ්‍ය උපදෙස් ලබාදෙන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0717/'09

5\.

ගරු රවි කරුණානායක මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 මැයි මස 19 වැනි දින සිට මෙරට සංචාරයට එරෙහි අනතුරු ඇඟවීම් ඉවත් කර ගත් රටවල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රටවල නම් කවරේද;

(iii) ශ්‍රී ලංකාවට පැමිණීම සම්බන්ධයෙන් තවමත් සංචාරකයන්ට අනතුරු අඟවන රටවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එවැනි සීමාවන් පනවන රටවල් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) මෙරට සංචාරවලට එරෙහි අනතුරු ඇඟවීම් ඉවත් කිරීමට හදිසි නීතියේ පැවැත්ම බාධාවක් වී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0757/'09

6\.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගෝල්ඩන් කී ආයතනය සම්බන්ධයෙන්, 2004 වර්ෂයේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආරම්භ කරන ලද පරීක්ෂණ, 2005 ජනාධිපතිවරණයෙන් පසුව නවතා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) 2005 ආරම්භ වූ පරීක්ෂණය නැවැත්වීම හේතුවෙන් තැන්පත්කරුවන්ට විශාල පාඩුවක් සිදුව ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) 2005 එම පරීක්ෂණය නවතා දැමුවේ කවර පදනමක් යටතේද;

(ii) මෙම තැන්පත්කරුවන්ට රජය මැදිහත් වී ලබාදෙන සහනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0771/'09

7\.

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2008 වසරේ මුදල් ප්‍රකාශයට අනුව දකුණු පළාත් සභාවේ මුළු වියදම, පුනරාවර්තන වියදම සහ ප්‍රාග්ධන වියදම කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මුදල් ප්‍රකාශය අනුව ගරු ආණ්ඩුකාරතුමියගේ නඩත්තුවට වෙන්කරන ලද මුදල කොපමණද;

(ii) 2008 වසරේදී වෙන්කරන ලද මුදලට අමතරව ගරු ආණ්ඩුකාරතුමියගේ නඩත්තුවට වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0804/'09

8\.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කය තුළ රා මැදීම පිණිස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් බලපත්‍ර ලබාදීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා පොල් ගස් කොපමණ සංඛ්‍යාවකට බලපත්‍ර ලබා දී තිබේද;

(iii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව එම බලපත්‍රලාභීන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත දිස්ත්‍රික්කයේ කෘත්‍රිම රා නිෂ්පාදනය කිරීම සඳහා බලපත්‍ර නිකුත්කර තිබේද;

(ii) එසේ නම්, එම බලපත්‍රලාභීන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) කෘත්‍රිම රා නිෂ්පාදනය සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය සහ දිනකට නිපදවන ප්‍රමාණය කොපමණද;

(iv) කෘත්‍රිම රා සහ රා මැදීම සඳහා බලපත්‍ර ලබා දී ඇති නිෂ්පාදන ආයතන වෙතින් මාසිකව ලබා ගන්නා රා ලීටර් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0806/'09

9\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයේ, ශීතකරණ සහ වායු සමීකරණ යන්ත්‍ර නඩත්තු අංශය විසින් රජයේ රෝහල්වල සිදු කරන වායු සමීකරණ හා මෘත ශරීර ශීතකරණ සේවා නඩත්තුව 2010 වසරේ සිට නතර කිරීමට තීරණයක් ගෙන තිබේද;

(ii) එසේ නම්, රජයේ රෝහල්වලට සපයන ලද එම සේවා නතර කිරීමට තීරණය කරන ලද්දේ කවර හේතු මතද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුඩා යන්ත්‍ර පමණක් නොව ශල්‍යාගාර වායු සමීකරණ යන්ත්‍ර හා මෘත ශරීර ශීතකරණ ආදිය ද පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන් මඟින් නඩත්තුකර ගැනීමට එකඟතාවය පළ කර තිබේද;

(ii) මෙම නඩත්තු නතර කිරීම සිදු කරන්නේ ලංකා විදුලිබල මණ්ඩලයේ වියදම් පාලනය කිරීමේ ක්‍රියාමාර්ගයක් වශයෙන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0811/'09

10\.

ගරු කේ. වී. සමන්ත විද්‍යාරත්න මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටා තිබෙන නමුණුකුල වතු සමාගමට අයත් වතු සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) එම වතු, නමුණුකුල වතු සමාගමට පැවරුවේ කවදාද;

(iii) එම එක් එක් වතුවල කොපමණ කොටස් ප්‍රමාණයක් නමුණුකුල වතු සමාගමට හිමිව තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සමාගමට අයත් තේ කර්මාන්තශාලා සංඛ්‍යාව, ඒ අතුරින් ක්‍රියාත්මකව පවතින සංඛ්‍යාව සහ වසා දමා තිබෙන සංඛ්‍යාව කොපමණද;

(ii) සමාගමට අයත් එක් එක් වතුවල කොපමණ කම්කරුවන් සංඛ්‍යාවක් සේවය කරන්නේද;

(iii) එම වතු සමාගම කම්කරුවන් වෙනුවෙන් ඔවුන්ගේ සේවක අර්ථසාධක අරමුදල් නිසි පරිදි අදාළ ගිණුම් වෙත ගෙවා තිබේද;

(iv) නියමිත දින නියමිත පරිදි කම්කරු වැටුප් ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2007 වර්ෂයෙන් පසු මෙම සමාගමට අයත් වතු, වෙනත් වැවිලි සමාගමකට බදු ක්‍රමයකට ලබා දී තිබේ නම්, එසේ ලබාදුන් වතු කවරේද;

(ii) එසේ වෙනත් සමාගමකට බදු ක්‍රමයකට වතු ලබා දිය හැකිද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0883/'09

11.

ගරු වජිර අබේවර්ධන මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1988.01.01 දින සිට 2006.01.01 දක්වා පහත සඳහන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා 6/2006 චක්‍රලේඛය මගින් රාජ්‍ය සේවයේ වැටුප් ප්‍රතිශෝධනය කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එම කාල සීමාවේදී කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කළ රාජ්‍ය විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් ද අනුරූපී පරිමාණයන් මත කල්පිත පදනමින් සංශෝධනය කිරීමේ විධිවිධාන පහත ගැසට් නිවේදනවලින් සලසා ඇතිබව එතුමා පිළිගන්නෙහිද? (රා.ප.ච.ලේ. 06/2006 හා 09/2007 හැර)

| එල්.ඩී.බී අංකය | දිනය | රා.පරි.ච.ලේ. අංකය |
|---|---|---|
| 97/41 | 1994.01.20 | 387 |
| 97/41(III) | 1994.01.20 | 37/92 |
| 97/41/(III) | 1998.10.28 | 2/97 (III) |
| 97/41/(III) හා 98.10.28 නිවේදනය හා අදාළ චක්‍රලේඛයේ 10 වැනි ඡේදය | | 15/2003 |
| අංක 1560/1 | 2008.07.28 | 09/2004 |

(ඇ) (i) රා.පරි.ච.ලේ. 06/2006 හා 09/2007 යටතේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදවූ රජයේ විශ්‍රාමිකයින්ට ද සංශෝධිත විශ්‍රාම වැටුප් ලබාගත හැකිවීමට අදාළ විධිවිධාන ඇතුළත් ගැසට් නිවේදනයක්/ චක්‍රලේඛයක් මෙතෙක් නිකුත් කර නොමැති බවත්;

(ii) පසුගිය වසර 18 තුළදී ඔවුනට දී ඇති අනුග්‍රහය 2006.01.01/ 2007.04.01 සිට සේවයේ යෙදුනු විශ්‍රාමිකයන්ට පමණක් ලැබී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) 09/2007 යටතේ සේවයේ යොදවන ලද විශ්‍රාමිකයන්ට එම අනුග්‍රහය ලබාදීමට අතිවිශේෂ ගැසට් නිවේදනයක්/චක්‍රලේඛයක් නිකුත් කිරීමට එතුමා පියවර ගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0719/'09

12.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වසර 10 තුළ සේවයේ යෙදී සිටි පොලිස් නිලධාරීන් සංඛ්‍යාව වාර්ෂික පදනමින් කොපමණද;

(ii) වඩා වැඩි නිලධාරි පිරිසක් සිටින කාණ්ඩ 5 හි සාමාන්‍ය වැටුප සහ ඔවුන්ගේ වැටුප් සහ දීමනා සඳහා පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පොලිස් බල ප්‍රදේශ හා කොට්ඨාස සමගින් දිවයිනේ ඇති පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) පොලිස් දෙපාර්තමේන්තුව පවතින්නේ මධ්‍යම රජය යටතේද, නැතහොත් පළාත් රාජ්‍ය සේවය යටතේද;

(iii) පළාත් රාජ්‍ය සේවය යටතේ පවතින්නේ නම්, ඒවා යටතේ ඇති කාර්යයන් කවරේද;

(iv) විශේෂ කාර්ය බලකාය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හා ජාත්‍යන්තර පොලිසියේ අපරාධ විමර්ශන කාර්යාංශය සඳහා වෙන්කර ඇති කාර්ය මණ්ඩලය කොපමණද;

(v) 17 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ස්ථාපිත පොලිස් කොමිසමේ අනුමතියෙන් තොරව ගන්නා ලද ක්‍රියාමාර්ග සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0807/'09

13.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දෙහිවල, නැදිමාල, රූපසිංහ පාර, අංක 13/1ඒ හි පදිංචි වෛද්‍ය මිසංග කාදර් මහත්මියගේ දියණිය වන නන්බිදි මුයිස් දැරිය නුගේගොඩ අනුලා විද්‍යාලයේ 2010 වසරට ඇතුළත් කිරීමට අයදුම්කර තිබුණේද;

(ii) ඇය සම්මුඛ පරීක්ෂණයට නොකැඳවා ඇයගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අනාගමික පදනම යටතේ ප්‍රතික්ෂේප කරන ලද්දේ නම් එය සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්වීමට තරම්වත් නුසුදුසුකමක් වන්නේ කෙසේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0763/'09

14.

ගරු රවි කරුණානායක මහතා,— නැවත පදිංචි කිරීම හා ආපදා සහන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුනාමිය සහ යුද්ධය නිසා අවතැන්වූවන් ඇතුළුව අද වන විට දිවයිනේ සිටින අභ්‍යන්තරව අවතැන්වූවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) කඳවුරුවල ජීවත්වන එවැනි පුද්ගලයින් සංඛ්‍යාව සහ එම කඳවුරු පවත්වාගෙන යාමට වැයවන පිරිවැය මාසික සහ පුද්ගල පදනමින් කොපමණද;

(iii) ඔවුන් අවතැන් වූ දිනයන් සහ පසුගිය වසර දෙක සඳහා මාසික, වාර්ෂික හා කඳවුරු පදනමින් පිරිවැය කවරේද;

(iv) මාසික, වාර්ෂික හා දිස්ත්‍රික් පදනමින් 2005 සිට 2009 වර්ෂයේ මේ දක්වා නැවත පදිංචි කළ පුද්ගලයන් හෝ පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මේ වන විට කඳවුරුවල සිටින අභ්‍යන්තරව අවතැන්වූවන්ගේ වයස් පිළිබඳ විස්තර කවරේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0808/'09

15.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පොල්හේන්ගොඩ පාර (විජය කුමාරතුංග මාවත) පුළුල් කිරීම වෙනුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කොළඹ මහ නගර සභාව විසින් සිදුකළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) අදාළ ඉඩම් අත්පත් කර ගැනීමේදී ඉඩම් අහිමි වන පාර්ශ්වයන්ට නීත්‍යානුකූල ඉඩම් අත්පත් කර ගැනීමේ වන්දි ප්‍රදානයක් සිදුකරන්නේද;

(ii) එම ප්‍රදානය ගණනය කරනු ලබන්නේ කවර පදනමකින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 460 වන අධිකාරය වන ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ (vi) කොටසේ 45 වැනි වගන්තියට අනුව වෙළෙඳපොළ වටිනාකම පදනම ලෙස සැලකිය යුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) මෙම ඉඩම් අහිමි වන අයට ලබාදෙන වන්දි දැනට තක්සේරුකර තිබේද;

(ii) එය මෙතරම් ප්‍රමාද වීමට හේතු කවරේද;

(iii) එම තක්සේරු වන්දි ප්‍රදානයන් සිදුකිරීමට කඩිනමින් පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමා,—පළාත් සභා (සංශෝධන),— 1987 අංක 42 දරන පළාත් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2009.05.26 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 4.00 දක්වා විය යුතු ය. අ. භා. 4.00 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, 2010 පෙබරවාරි මස 05 වැනි සිකුරාදා පාර්ලිමේන්තුව රැස්වන දිනයක් විය යුතු ය.

5.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3),— අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2010 පෙබරවාරි මස 05 වැනි සිකුරාදා පූ. භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය.

6.

ගරු නන්දමිත්‍ර ඒකනායක මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය:—

" බෞද්ධ සිද්ධස්ථාන පුනරුත්ථාපනය කිරීමේ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

7.

ගරු සරණ ගුණවර්ධන මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය:—

" ටී. බී. ඒකනායක පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව,— 1959 අංක 8 දරන පනතින් ද ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද, සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2010 ජනවාරි මස 02 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*2.

මැතිවරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

ඉන්දියානු ආගාමික කම්කරු (ඉවත්කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

වත්කම්වලින් ආවරණය වූ සුරැකුම්කරණය විධිමත් කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*10.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජූනි 17) [1]

*11.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*12.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*13.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*14.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*15.

සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*16.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*17.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*18.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*19.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*20.

වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*21.

ජාතික කාන්තා කොමිෂන් සභාව පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*22.

ජාතික සේවක අධ්‍යයන ආයතන පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*23.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*24.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග (අංක 1),—ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සහ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ එකී පනතේ 14 වගන්තිය සමඟ කියවිය යුතු, ආනයන හා අපනයන (පාලන) පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සාදනු ලදුව, 2009 නොවැම්බර් මස 09 දිනැති අංක 1627/1 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.12.08 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*25.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග (අංක 2),—ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සහ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 14 වැනි වගන්තිය සහ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සමඟ කියවිය යුතු ආනයන හා අපනයන (පාලන) පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සාදන ලදුව, 2009 නොවැම්බර් මස 09 දිනැති අංක 1627/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.12.08 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*26.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග (අංක 3),—ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සහ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සාදන ලදුව, 2009 නොවැම්බර් මස 09 දිනැති අංක 1627/3 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.12.08 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*27.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතු යැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 70,000/- |
| | රු. 1,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 65,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 63,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*28.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා, වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*29.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිතුමාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 27,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 25,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 22,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*30.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අගවිනිසුරුවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*31.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— දුම්කොළ බදු පනත යටතේ වූ නියෝග,— 1999 අංක 08 දරන දුම්කොළ බදු පනතේ 21 වැනි වගන්තිය යටතේ සිගරැට්, සුරුට්ටු, බීඩි හෝ පයිප්ප දුම්කොළ සඳහා වූ අමුද්‍රව්‍ය හෝ නිමි භාණ්ඩ නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම සම්බන්ධයෙන් වැඩබලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2009 ජූලි මස 17 වැනි දිනැති අංක 1610/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.10. 08 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*32.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥාපනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*33.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥාපනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥාපනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*34.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— වෛද්‍ය ආඥාපනත යටතේ නියෝග,— (105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2009 පෙබරවාරි මස 25 දිනැති අංක 1590/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*35.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*36.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*37.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2006,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2006.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*38.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වාර්ෂික වාර්තාව 2007,— 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*39.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2006,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 40(3) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි මස 01 වැනි දින සිට 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ අතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*40.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2006,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වැනි වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි 01 වැනි දින සිට 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

41.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

42.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

43.

දේශමාන්‍ය එච්. කේ. ධර්මදාස කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

44.

ශ්‍රී පියරතන ප්‍රජා සංවර්ධන සහ සමාජීය පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

45.

ග්ලෝබල් හ්‍යුමනිටේරියන් ෆවුන්ඩේෂන් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

46.
බලහත්කාරයෙන් ආගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත — සලකා බැලීම.

47.
සිරිනිවෙස් ප්‍රජාමිත්‍ර සහයෝගීතා කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— සලකා බැලීම.

48.
හැම්ප්ටන් විලේජ් ශ්‍රී ලංකා භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— සලකා බැලීම.

49.
මාළිගාවත්ත ජනාසා සහ සුභසාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— සලකා බැලීම.

50.
පුලතිසි දරුවෝ පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— සලකා බැලීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**
" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0551/'09

1.
ගරු අජිත් කුමාර මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අක්මීමණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දුරකථන සමාගම් විසින් මේ වනවිට සවිකර තිබෙන දුරකථන සන්නිවේදන කුලුනු සංඛ්‍යාව හා එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(ii) අදාළ සමාගම් හා කුලුනු සවිකල වර්ෂයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කුලුනු සවිකිරීමට අදාළව ඉටුකළ යුතු කොන්දේසි කවරේද;

(ii) මෙහිදී අදාළ දුරකථන සමාගම් විසින් එක් එක් ස්ථාන සඳහා අදාළ කොන්දේසි සපුරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) අදාළ කොන්දේසි සපුරා නොමැති විට, දුරකථන කුලුනු සවිකිරීමට පළාත් පාලන ආයතනය අනුමතිය දී ඇත්නම් එය වරදක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, ඒ සම්බන්ධව ගනු ලබන ක්‍රියා මාර්ගය කවරේද;

(ii) කුලුනු සවිකිරීමේදී පළාත් පාලන ආයතනයට ලැබිය යුතු මුදල හා ලැබී ඇති මුදල වෙන වෙනම කොපමණද;

(iii) අදාළ මුදල් ලැබී නොමැති නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(iv) පළාත් පාලන ආයතනයට මෙතෙක් ලැබී ඇති ඉහත මුදල් වැයකර ඇත්තේ කවර කටයුතු සඳහා ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0552/'09

2\.

ගරු අජිත් කුමාර මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බෝපේ - පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දූරකථන සමාගම් විසින් මේ වනවිට සවිකර තිබෙන දූරකථන සන්නිවේදන කුලුනු සංඛ්‍යාව හා එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(ii) අදාළ සමාගම් හා කුලුනු සවිකළ වර්ෂයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කුලුනු සවිකිරීමට අදාළව ඉටුකළ යුතු කොන්දේසි කවරේද;

(ii) මෙහිදී, අදාළ දූරකථන සමාගම් විසින් එක් එක් ස්ථාන සඳහා අදාළ කොන්දේසි සපුරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) අදාළ කොන්දේසි සපුරා නොමැති විට, දූරකථන කුලුනු සවිකිරීමට පළාත් පාලන ආයතනය අනුමතිය දී ඇත්නම් එය වරදක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, ඒ සම්බන්ධව ගනු ලබන ක්‍රියා මාර්ගය කවරේද;

(ii) කුලුනු සවිකිරීමේදී පළාත් පාලන ආයතනයට ලැබිය යුතු මුදල හා ලැබී ඇති මුදල වෙන වෙනම කොපමණද;

(iii) අදාළ මුදල් ලැබී නොමැති නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(iv) පළාත් පාලන ආයතනයට මෙතෙක් ලැබී ඇති ඉහත මුදල වැයකර ඇත්තේ කවර කටයුතු සඳහා ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0553/'09

3\.

ගරු අජිත් කුමාර මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හික්කඩුව නගර සභා බල ප්‍රදේශය තුල දූරකථන සමාගම් විසින් මේ වනවිට සවිකර තිබෙන දූරකථන සන්නිවේදන කුලුනු සංඛ්‍යාව හා එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(ii) අදාළ සමාගම් හා කුලුනු සවිකල වර්ෂයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කුලුනු සවිකිරීමට අදාළව ඉටුකළ යුතු කොන්දේසි කවරේද;

(ii) මෙහිදී, අදාළ දූරකථන සමාගම් විසින් එක් එක් ස්ථාන සඳහා අදාළ කොන්දේසි සපුරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) අදාළ කොන්දේසි සපුරා නොමැති විට, දූරකථන කුලුනු සවිකිරීමට පළාත් පාලන ආයතනය අනුමතිය දී ඇත්නම් එය වරදක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, ඒ සම්බන්ධව ගනු ලබන ක්‍රියා මාර්ගය කවරේද;

(ii) කුලුනු සවිකිරීමේදී පළාත් පාලන ආයතනයට ලැබිය යුතු මුදල හා ලැබී ඇති මුදල වෙන වෙනම කොපමණද;

(iii) අදාළ මුදල් ලැබී නොමැති නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(iv) පළාත් පාලන ආයතනයට මෙතෙක් ලැබී ඇති ඉහත මුදල් වැයකර ඇත්තේ කවර කටයුතු සඳහා ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0554/'09

4.
ගරු අජිත් කුමාර මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බද්දේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දුරකථන සමාගම් විසින් මේ වනවිට සවිකර තිබෙන දුරකථන සන්නිවේදන කුලුනු සංඛ්‍යාව හා එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(ii) අදාළ සමාගම් හා කුලුනු සවිකල වර්ෂයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කුලුනු සවිකිරීමට අදාළව ඉටුකළ යුතු කොන්දේසි කවරේද;

(ii) මෙහිදී අදාළ දුරකථන සමාගම් විසින් එක් එක් ස්ථාන සඳහා අදාළ කොන්දේසි සපුරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) අදාළ කොන්දේසි සපුරා නොමැති විට, දුරකථන කුලුනු සවිකිරීමට පළාත් පාලන ආයතනය අනුමතිය දී ඇත්නම් එය වරදක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, ඒ සම්බන්ධව ගනු ලබන ක්‍රියා මාර්ගය කවරේද;

(ii) කුලුනු සවිකිරීමේදී පළාත් පාලන ආයතනයට ලැබිය යුතු මුදල හා ලැබී ඇති මුදල වෙන වෙනම කොපමණද;

(iii) අදාළ මුදල් ලැබී නොමැති නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(iv) පළාත් පාලන ආයතනයට මෙතෙක් ලැබී ඇති ඉහත මුදල් වැයකර ඇත්තේ කවර කටයුතු සඳහා ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0555/'09

5.
ගරු අජිත් කුමාර මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දුරකථන සමාගම් විසින් මේ වනවිට සවිකර තිබෙන දුරකථන සන්නිවේදන කුලුනු සංඛ්‍යාව හා එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(ii) අදාළ සමාගම් හා කුලුනු සවිකල වර්ෂයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කුලුනු සවිකිරීමට අදාළව ඉටුකළ යුතු කොන්දේසි කවරේද;

(ii) මෙහිදී අදාළ දුරකථන සමාගම් විසින් එක් එක් ස්ථාන සඳහා අදාළ කොන්දේසි සපුරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) අදාළ කොන්දේසි සපුරා නොමැති විට, දුරකථන කුලුනු සවිකිරීමට පළාත් පාලන ආයතනය අනුමතිය දී ඇත්නම් එය වරදක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, ඒ සම්බන්ධව ගනු ලබන ක්‍රියා මාර්ගය කවරේද;

(ii) කුලුනු සවිකිරීමේදී පළාත් පාලන ආයතනයට ලැබිය යුතු මුදල හා ලැබී ඇති මුදල වෙන වෙනම කොපමණද;

(iii) අදාළ මුදල් ලැබී නොමැති නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(iv) පළාත් පාලන ආයතනයට මෙතෙක් ලැබී ඇති ඉහත මුදල් වැයකර ඇත්තේ කවර කටයුතු සඳහාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0556/'09

6.

ගරු අජිත් කුමාර මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(2)

(අ) (i) නියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දුරකථන සමාගම් විසින් මේ වනවිට සවිකර තිබෙන දුරකථන සන්නිවේදන කුලුනු සංඛ්‍යාව හා එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(ii) අදාළ සමාගම් හා කුලුනු සවිකල වර්ෂයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කුලුනු සවිකිරීමට අදාළව ඉටුකළ යුතු කොන්දේසි කවරේද;

(ii) මෙහිදී අදාළ දුරකථන සමාගම් විසින් එක් එක් ස්ථාන සඳහා අදාළ කොන්දේසි සපුරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) අදාළ කොන්දේසි සපුරා නොමැති විට, දුරකථන කුලුනු සවිකිරීමට පළාත් පාලන ආයතනය අනුමතිය දී ඇත්නම් එය වරදක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, ඒ සම්බන්ධව ගනු ලබන ක්‍රියා මාර්ගය කවරේද;

(ii) කුලුනු සවිකිරීමේදී පළාත් පාලන ආයතනයට ලැබිය යුතු මුදල හා ලැබී ඇති මුදල වෙන වෙනම කොපමණද;

(iii) අදාළ මුදල් ලැබී නොමැති නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(iv) පළාත් පාලන ආයතනයට මෙතෙක් ලැබී ඇති ඉහත මුදල් වැයකර ඇත්තේ කවර කටයුතු සඳහා ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0557/'09

7.

ගරු අජිත් කුමාර මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(2)

(අ) (i) නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දුරකථන සමාගම් විසින් මේ වනවිට සවිකර තිබෙන දුරකථන සන්නිවේදන කුලුනු සංඛ්‍යාව හා එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(ii) අදාළ සමාගම් හා කුලුනු සිවිකල වර්ෂයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කුලුනු සවිකිරීමට අදාළව ඉටුකළ යුතු කොන්දේසි කවරේද;

(ii) මෙහිදී අදාළ දූරකථන සමාගම් විසින් එක් එක් ස්ථාන සඳහා අදාළ කොන්දේසි සපුරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) අදාළ කොන්දේසි සපුරා නොමැති විට, දූරකථන කුලුනු සවිකිරීමට පළාත් පාලන ආයතනය අනුමතිය දී ඇත්නම් එය වරදක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, ඒ සම්බන්ධව ගනු ලබන ක්‍රියා මාර්ගය කවරේද;

(ii) කුලුනු සවිකිරීමේදී පළාත් පාලන ආයතනයට ලැබිය යුතු මුදල හා ලැබී ඇති මුදල වෙන වෙනම කොපමණද;

(iii) අදාළ මුදල් ලැබී නොමැති නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(iv) පළාත් පාලන ආයතනයට මෙතෙක් ලැබී ඇති ඉහත මුදල් වැයකර ඇත්තේ කවර කටයුතු සඳහා ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0558/'09

8.

ගරු අජිත් කුමාර මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නෙළුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දූරකථන සමාගම් විසින් මේ වනවිට සවිකර තිබෙන දූරකථන සන්නිවේදන කුලුනු සංඛ්‍යාව හා එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(ii) අදාළ සමාගම් හා කුලුනු සවිකල වර්ෂයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කුලුනු සවිකිරීමට අදාළව ඉටුකළ යුතු කොන්දේසි කවරේද;

(ii) මෙහිදී අදාළ දූරකථන සමාගම් විසින් එක් එක් ස්ථාන සඳහා අදාළ කොන්දේසි සපුරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) අදාළ කොන්දේසි සපුරා නොමැති විට, දූරකථන කුලුනු සවිකිරීමට පළාත් පාලන ආයතනය අනුමතිය දී ඇත්නම් එය වරදක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, ඒ සම්බන්ධව ගනු ලබන ක්‍රියා මාර්ගය කවරේද;

(ii) කුලුනු සවිකිරීමේදී පළාත් පාලන ආයතනයට ලැබිය යුතු මුදල හා ලැබී ඇති මුදල වෙන වෙනම කොපමණද;

(iii) අදාළ මුදල් ලැබී නොමැති නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(iv) පළාත් පාලන ආයතනයට මෙතෙක් ලැබී ඇති ඉහත මුදල් වැයකර ඇත්තේ කවර කටයුතු සඳහා ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0559/'09

9\.
ගරු අජිත් කුමාර මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දුරකථන සමාගම් විසින් මේ වනවිට සවිකර තිබෙන දුරකථන සන්නිවේදන කුලුනු සංඛ්‍යාව හා එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(ii) අදාළ සමාගම් හා කුලුනු සවිකල වර්ෂයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කුලුනු සවිකිරීමට අදාළව ඉටුකළ යුතු කොන්දේසි කවරේද;

(ii) මෙහිදී අදාළ දුරකථන සමාගම් විසින් එක් එක් ස්ථාන සඳහා අදාළ කොන්දේසි සපුරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) අදාළ කොන්දේසි සපුරා නොමැති විට, දුරකථන කුලුනු සවිකිරීමට පළාත් පාලන ආයතනය අනුමතිය දී ඇත්නම් එය වරදක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, ඒ සම්බන්ධව ගනු ලබන ක්‍රියා මාර්ගය කවරේද;

(ii) කුලුනු සවිකිරීමේදී පළාත් පාලන ආයතනයට ලැබිය යුතු මුදල හා ලැබී ඇති මුදල වෙන වෙනම කොපමණද;

(iii) අදාළ මුදල් ලැබී නොමැති නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග යකවරේද;

(iv) පළාත් පාලන ආයතනයට මෙතෙක් ලැබී ඇති ඉහත මුදල් වැයකර ඇත්තේ කවර කටයුතු සඳහා ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0560/'09

10\.
ගරු අජිත් කුමාර මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දුරකථන සමාගම් විසින් මේ වනවිට සවිකර තිබෙන දුරකථන සන්නිවේදන කුලුනු සංඛ්‍යාව හා එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(ii) අදාළ සමාගම් හා කුලුනු සවිකල වර්ෂයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කුලුනු සවිකිරීමට අදාළව ඉටුකළ යුතු කොන්දේසි කවරේද;

(ii) මෙහිදී, අදාළ දුරකථන සමාගම් විසින් එක් එක් ස්ථාන සඳහා අදාළ කොන්දේසි සපුරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) අදාළ කොන්දේසි සපුරා නොමැති විට, දුරකථන කුලුනු සවිකිරීමට පළාත් පාලන ආයතනය අනුමතිය දී ඇත්නම් එය වරදක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, ඒ සම්බන්ධව ගනු ලබන ක්‍රියා මාර්ගය කවරේද;

(ii) කුලුනු සවිකිරීමේදී පළාත් පාලන ආයතනයට ලැබිය යුතු මුදල හා ලැබී ඇති මුදල වෙන වෙනම කොපමණද;

(iii) අදාළ මුදල් ලැබී නොමැති නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(iv) පළාත් පාලන ආයතනයට මෙතෙක් ලැබී ඇති ඉහත මුදල් වැයකර ඇත්තේ කවර කටයුතු සඳහාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0561/'09

11.

ගරු අජිත් කුමාර මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දූරකථන සමාගම් විසින් මේ වනවිට සවිකර තිබෙන දූරකථන සන්නිවේදන කුලුනු සංඛ්‍යාව හා එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(ii) අදාළ සමාගම් හා කුලුනු සවිකල වර්ෂයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කුලුනු සවිකිරීමට අදාළව ඉටුකළ යුතු කොන්දේසි කවරේද;

(ii) මෙහිදී අදාළ දූරකථන සමාගම් විසින් එක් එක් ස්ථාන සඳහා අදාළ කොන්දේසි සපුරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) අදාළ කොන්දේසි සපුරා නොමැති විට, දූරකථන කුලුනු සවිකිරීමට පළාත් පාලන ආයතනය අනුමතිය දී ඇත්නම් එය වරදක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, ඒ සම්බන්ධව ගනු ලබන ක්‍රියා මාර්ගය කවරේද;

(ii) කුලුනු සවිකිරීමේදී පළාත් පාලන ආයතනයට ලැබිය යුතු මුදල හා ලැබී ඇති මුදල වෙන වෙනම කොපමණද;

(iii) අදාළ මුදල් ලැබී නොමැති නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(iv) පළාත් පාලන ආයතනයට මෙතෙක් ලැබී ඇති මුදල් ඉහත මුදල් වැයකර ඇත්තේ කවර කටයුතු සඳහා ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0562/'09

12.

ගරු අජිත් කුමාර මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඇල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දූරකථන සමාගම් විසින් මේ වනවිට සවිකර තිබෙන දූරකථන සන්නිවේදන කුලුනු සංඛ්‍යාව හා එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(ii) අදාළ සමාගම් හා කුලුනු සවිකල වර්ෂයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කුලුනු සවිකිරීමට අදාළව ඉටුකළ යුතු කොන්දේසි කවරේද;

(ii) මෙහිදී අදාළ දූරකථන සමාගම් විසින් එක් එක් ස්ථාන සඳහා අදාළ කොන්දේසි සපුරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) අදාළ කොන්දේසි සපුරා නොමැති විට, දූරකථන කුලුනු සවිකිරීමට පළාත් පාලන ආයතනය අනුමතිය දී ඇත්නම් එය වරදක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, ඒ සම්බන්ධව ගනු ලබන ක්‍රියා මාර්ගය කවරේද;

(ii) කුලුනු සවිකිරීමේදී පළාත් පාලන ආයතනයට ලැබිය යුතු මුදල හා ලැබී ඇති මුදල වෙන වෙනම කොපමණද;

(iii) අදාළ මුදල් ලැබී නොමැති නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) පළාත් පාලන ආයතනයට මෙතෙක් ලැබී ඇති ඉහත මුදල් වැයකර ඇත්තේ කවර කටයුතු සඳහා ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0563/'09

13.
ගරු අජිත් කුමාර මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බෙන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දූරකථන සමාගම් විසින් මේ වනවිට සවිකර තිබෙන දූරකථන සන්නිවේදන කුලුනු සංඛ්‍යාව හා එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(ii) අදාළ සමාගම් හා කුලුනු සවිකල වර්ෂයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කුලුනු සවිකිරීමට අදාළව ඉටුකළ යුතු කොන්දේසි කවරේද;

(ii) මෙහිදී අදාළ දූරකථන සමාගම් විසින් එක් එක් ස්ථාන සඳහා අදාළ කොන්දේසි සපුරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) අදාළ කොන්දේසි සපුරා නොමැති විට, දූරකථන කුලුනු සවිකිරීමට පළාත් පාලන ආයතනය අනුමතිය දී ඇත්නම් එය වරදක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, ඒ සම්බන්ධව ගනු ලබන ක්‍රියා මාර්ගය කවරේද;

(ii) කුලුනු සවිකිරීමේදී පළාත් පාලන ආයතනයට ලැබිය යුතු මුදල හා ලැබී ඇති මුදල වෙන වෙනම කොපමණද;

(iii) අදාළ මුදල් ලැබී නොමැති නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(iv) පළාත් පාලන ආයතනයට මෙතෙක් ලැබී ඇති ඉහත මුදල් වැයකර ඇත්තේ කවර කටයුතු සඳහාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0564/'09

14.
ගරු අජිත් කුමාර මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බලපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දූරකථන සමාගම් විසින් මේ වනවිට සවිකර තිබෙන දූරකථන සන්නිවේදන කුලුනු සංඛ්‍යාව හා එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(ii) අදාළ සමාගම් හා කුලුනු සවිකල වර්ෂයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කුලුනු සවිකිරීමට අදාළව ඉටුකළ යුතු කොන්දේසි කවරේද;

(ii) මෙහිදී අදාළ දූරකථන සමාගම් විසින් එක් එක් ස්ථාන සඳහා අදාළ කොන්දේසි සපුරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) අදාළ කොන්දේසි සපුරා නොමැති විට, දූරකථන කුලුනු සවිකිරීමට පළාත් පාලන ආයතනය අනුමතිය දී ඇත්නම් එය වරදක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, ඒ සම්බන්ධව ගනු ලබන ක්‍රියා මාර්ගය කවරේද;

(ii) කුලුනු සවිකිරීමේදී පළාත් පාලන ආයතනයට ලැබිය යුතු මුදල හා ලැබී ඇති මුදල වෙන වෙනම කොපමණද;

(iii) අදාළ මුදල් ලැබී නොමැති නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(iv) පළාත් පාලන ආයතනයට ලැබුණු ඉහත මුදල වැයකර ඇත්තේ කවර කටයුතු සඳහා ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0565/'09

15\.

ගරු අජිත් කුමාර මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගාල්ල මහ නගර සභා බල ප්‍රදේශය තුළ දූරකථන සමාගම් විසින් මේ වනවිට සවිකර තිබෙන දූරකථන සන්නිවේදන කුලුනු සංඛ්‍යාව හා එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(ii) අදාළ සමාගම් හා කුලුනු සවිකල වර්ෂයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කුලුනු සවිකිරීමට අදාළව ඉටුකළ යුතු කොන්දේසි කවරේද;

(ii) මෙහිදී අදාළ දූරකථන සමාගම් විසින් එක් එක් ස්ථාන සඳහා අදාළ කොන්දේසි සපුරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) අදාළ කොන්දේසි සපුරා නොමැති විට, දූරකථන කුලුනු සවිකිරීමට පළාත් පාලන ආයතනය අනුමතිය දී ඇත්නම් එය වරදක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, ඒ සම්බන්ධව ගනු ලබන ක්‍රියා මාර්ගය කවරේද;

(ii) කුලුනු සවිකිරීමේදී පළාත් පාලන ආයතනයට ලැබිය යුතු මුදල හා ලැබී ඇති මුදල වෙන වෙනම කොපමණද;

(iii) අදාළ මුදල් ලැබී නොමැති නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(iv) පළාත් පාලන ආයතනයට මෙතෙක් ලැබී ඇති ඉහත මුදල් වැයකර ඇත්තේ කවර කටයුතු සඳහාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0566/'09

16.

ගරු අජිත් කුමාර මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දූරකථන සමාගම් විසින් මේ වනවිට සවිකර තිබෙන දූරකථන සන්නිවේදන කුළුනු සංඛ්‍යාව හා එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(ii) අදාළ සමාගම් හා කුළුනු සවිකල වර්ෂයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කුළුනු සවිකිරීමට අදාළව ඉටුකළ යුතු කොන්දේසි කවරේද;

(ii) මෙහිදී අදාළ දූරකථන සමාගම් විසින් එක් එක් ස්ථාන සඳහා අදාළ කොන්දේසි සපුරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) අදාළ කොන්දේසි සපුරා නොමැති විට, දූරකථන කුළුනු සවිකිරීමට පළාත් පාලන ආයතනය අනුමතිය දී ඇත්නම් එය වරදක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, ඒ සම්බන්ධව ගනු ලබන ක්‍රියා මාර්ගය කවරේද;

(ii) කුළුනු සවිකිරීමේදී පළාත් පාලන ආයතනයට ලැබිය යුතු මුදල හා ලැබී ඇති මුදල වෙන වෙනම කොපමණද;

(iii) අදාළ මුදල් ලැබී නොමැති නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(iv) පළාත් පාලන ආයතනයට මෙතෙක් ලැබී ඇති ඉහත මුදල් වැයකර ඇත්තේ කවර කටයුතු සඳහාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0567/'09

17.

ගරු අජිත් කුමාර මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ දූරකථන සමාගම් විසින් මේ වනවිට සවිකර තිබෙන දූරකථන සන්නිවේදන කුළුනු සංඛ්‍යාව හා එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(ii) අදාළ සමාගම් හා කුළුනු සවිකල වර්ෂයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කුළුනු සවිකිරීමට අදාළව ඉටුකළ යුතු කොන්දේසි කවරේද;

(ii) මෙහිදී අදාළ දූරකථන සමාගම් විසින් එක් එක් ස්ථාන සඳහා අදාළ කොන්දේසි සපුරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) අදාළ කොන්දේසි සපුරා නොමැති විට, දූරකථන කුළුනු සවිකිරීමට පළාත් පාලන ආයතනය අනුමතිය දී ඇත්නම් එය වරදක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, ඒ සම්බන්ධව ගනු ලබන ක්‍රියා මාර්ගය කවරේද;

(ii) කුළුනු සවිකිරීමේදී පළාත් පාලන ආයතනයට ලැබිය යුතු මුදල හා ලැබී ඇති මුදල වෙන වෙනම කොපමණද;

(iii) අදාළ මුදල් ලැබී නොමැති නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(iv) පළාත් පාලන ආයතනයට මෙතෙක් ලැබී ඇති ඉහත මුදල් වැයකර ඇත්තේ කවර කටයුතු සඳහාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0568/'09

18.

ගරු අජිත් කුමාර මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉමදූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දුරකථන සමාගම් විසින් මේ වනවිට සවිකර තිබෙන දුරකථන සන්නිවේදන කුලුනු සංඛ්‍යාව හා එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(ii) අදාළ සමාගම් හා කුලුනු සවිකල වර්ෂයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කුලුනු සවිකිරීමට අදාළව ඉටුකළ යුතු කොන්දේසි කවරේද;

(ii) මෙහිදී අදාළ දුරකථන සමාගම් විසින් එක් එක් ස්ථාන සඳහා අදාළ කොන්දේසි සපුරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) අදාළ කොන්දේසි සපුරා නොමැති විට, දුරකථන කුලුනු සවිකිරීමට පළාත් පාලන ආයතනය අනුමතිය දී ඇත්නම් එය වරදක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, ඒ සම්බන්ධව ගනු ලබන ක්‍රියා මාර්ගය කවරේද;

(ii) කුලුනු සවිකිරීමේදී පළාත් පාලන ආයතනයට ලැබිය යුතු මුදල හා ලැබී ඇති මුදල වෙන වෙනම කොපමණද;

(iii) අදාළ මුදල් ලැබී නොමැති නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(iv) පළාත් පාලන ආයතනයට මෙතෙක් ලැබී ඇති ඉහත මුදල් වැයකර ඇත්තේ කවර කටයුතු සඳහාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0569/'09

19.

ගරු අජිත් කුමාර මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හබරාදූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දුරකථන සමාගම් විසින් මේ වනවිට සවිකර තිබෙන දුරකථන සන්නිවේදන කුලුනු සංඛ්‍යාව හා එම ස්ථානයන්හි ලිපිනයන් කවරේද;

(ii) අදාළ සමාගම් හා කුලුනු සවිකල වර්ෂයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කුලුනු සවිකිරීමට අදාළව ඉටුකළ යුතු කොන්දේසි කවරේද;

(ii) මෙහිදී අදාළ දුරකථන සමාගම් විසින් එක් එක් ස්ථාන සඳහා අදාළ කොන්දේසි සපුරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) අදාළ කොන්දේසි සපුරා නොමැති විට, දුරකථන කුලුනු සවිකිරීමට පළාත් පාලන ආයතනය අනුමතිය දී ඇත්නම් එය වරදක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, ඒ සම්බන්ධව ගනු ලබන ක්‍රියා මාර්ගය කවරේද;

(ii) කුලුනු සවිකිරීමේදී පළාත් පාලන ආයතනයට ලැබිය යුතු මුදල හා ලැබී ඇති මුදල වෙන වෙනම කොපමණද;

(iii) අදාළ මුදල් ලැබී නොමැති නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(iv) පළාත් පාලන ආයතනයට මෙතෙක් ලැබී ඇති ඉහත මුදල් වැයකර ඇත්තේ කවර කටයුතු සඳහාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?